**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**
**சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்**
**Department of Samurdhi Development**

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/SW/14/19/01/Circular | ඔබේ අංකය / உமது இல / Your No: ........................................... | දිනය / திகதி / Date: 2022.03.10 |

සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ/ දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂ,
සමෘද්ධි කළමනාකරුවන්/ ප්‍රවර්ධන නිලධාරි / සමෘද්ධි සංවර්ධන නිලධාරින් වෙත.

**<u>ආර්ථික වශයෙන් ශක්තිමත් වූ ප්‍රතිලාභීන් සහිත සමෘද්ධි සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 2022</u>**

සමෘද්ධි වැඩසටහන ආරම්භයේ සිට වසම් වට්ටමින් ක්‍රියාත්මක වෙමින් පවතින හා ඉදිරියේදී ක්‍රියාත්මක වීමට නියමිත සමෘද්ධි වැඩසටහන් වල ප්‍රතිලාභ අනෙකුත් අඩුආදායම්ලාභී පවුල් වෙතද ලබාදීමට හැකිවන පරිදි මෙන්ම මේ වන විට සමෘද්ධි වැඩසටහන තුල හඳුනාගෙන ඇති විෂමතාවයන් අවම කිරීමටද හැකිවන පරිදි ක්‍රියාමාර්ග සකස් කල යුතුව ඇත. ඒ අනුව පහත සඳහන් කාණ්ඩවලට ඇතුලත් සමෘද්ධි සහනාධාරලාභී පවුල්වල මාසික සමෘද්ධි සහනාධාරය සංශෝධනය කිරීම ග්‍රාමීය කමිටු නිර්දේශ මත සිදුකල යුතු වේ.

I. බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව මගින්,බහුකාර්ය සහයකයින් ලෙස තෝරාගෙන එකී කාර්යවල නිරතව සිටින සාමාජිකයින් හා උපාධිධාරී සංවර්ධන නිලධාරි ඇතුලත් පවුල් .

II. සමෘද්ධි අධිකාරිය හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් 2021 වර්ෂය දක්වා ජීවනෝපාය සංවර්ධනය තුලින් සවිබල ගැන්වීමට අදාල ව්‍යාපෘති සඳහා සමෘද්ධි සහනාධාරලාභීන්ගෙන් තෝරාගන්නා ලද පවුල් අතරින් දිළිඳුකම ජයගත් පවුල්.

III. අප අමාත්‍යාංශය මගින් 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද සෞභාග්‍යා ආදර්ශ ගම්මාන වැඩසටහන සඳහා සමෘද්ධි සහනාධාරලාභීන්ගෙන් තෝරාගන්නා ලද පවුල් අතරින් ජීවන තත්වය උසස් කරගන්නා ලද පවුල්.

IV. ඉතා දීර්ඝ කාලයක සිට සමෘද්ධි වැඩසටහන තුල රැඳී සිටිමින් විවධ ආයතන මගින් ප්‍රතිලාභ ලබා ජීවන තත්වය උසස් කරගන්නා ලද සමෘද්ධි සහනාධාරලාභී පවුල්.

V. ආදායම් උත්පාදන මාර්ග වල යෙදවිය හැකි චංචල හා නිශ්චල දේපළ හිමි සාමාජිකයින් සිටින සමෘද්ධි සහනාධාරලාභී පවුල්

උදා:- ත්‍රීවීලර්, ට්‍රැක්ටර්, බස් ,ලොරි, කඩකාමර, කුලී නිවාස ආදිය

VI. රන්පත්ලාභීන් ලෙස ස්වකැමැත්තෙන්ම සහනාධාර රජයට භාරදෙන පවුල්.

**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

02. ඉහත සඳහන් II, III, IV, V හා VI කරුණු වලට අදාළව මීට පෙර ලබා දී ඇති උපදෙස් පරිදි ග්‍රාමීය කමිටු නිර්දේශ මත පදනම්ව ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව තෝරාගන්නා ලද සමෘද්ධි සහනාධාරලාභී පවුල් වල සහනාධාර වටිනාකම් සංශෝධනය කල යුතු අතර, එම පවුල් සඳහා රු. 420/- වටිනාකම යටතේ සහනාධාර මුදලක් ලබාදී සමාජ ආරක්ෂණ, නිවාස ලොතරැයි හා අනිවාර්ය ඉතුරුම් ප්‍රතිලාභ අඛණ්ඩව ලබාදීම, රන්පත්ලාභී පවුල් ලෙස රන්පත් සහතික පත්‍ර ප්‍රදානය තුළින් ඇගයීමකට ලක්කිරිම හා සමෘද්ධි බැංකු මගින් අඩු පොළී ණය පහසුකම් සලසා දීමට කටයුතු කල යුතු අතර, මෙම ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යමින් පෙර දැනුම් දී ඇති පරිදි රන්පත්ලාභී පවුල් වල ප්‍රගතිය සති දෙකකට වරක් අනිවාර්යයෙන් ප්‍රධාන කාර්යාලය වෙත ලබාදිය යුතු වේ.

03. තවද සමෘද්ධි සහනාධාර හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ හිමිවිය යුතු පවුල ලෙස මින් ඉදිරියට අර්ථකතනය කල යුත්තේ " **එකම නිවසක වෙසෙන ස්වාමි පුරුෂයා බිරිඳ හා ඔවුන්ගේ අවිවාහක දරුවන් පමණක්** " වන බවට සමාජ ආරක්ෂණ කලමනාකරණ මණ්ඩලය විසින් තීරණය කර ඇත. ඒ අනුව එකම ගෘහයක්තුල වෙසෙන පවුලක් සඳහා කුමන හෝ වටිනාකමක් යටතේ සමෘද්ධි සහනාධාර හිමිව ඇත්නම් එහි වෙසෙන අනු පවුල් සඳහා මෙම සමෘද්ධි සහනාධාරය හිමි නොවිය යුතුය.

04. එමෙන්ම, සහනාධාර වටිනාකම් ඉවත් වීම හෝ සහනාධාර සංශෝධනය තුළින් ඉතිරිවන මුදල් වටිනාකම් වලට අදාළව වසම් මට්ටමින් නව සමෘද්ධි සහනාධාර නිකුත් කිරීම නැවත දන්වන තුරු තාවකාලිකව නතර කල යුතු වේ. එහෙත් කිසියම් අත්‍යවශ්‍ය වූ විශේෂ හේතුවක් මත කරනු ලබන ඉල්ලීමක් වේ නම් ඒ පිළිබඳව සලකා බැලීම සඳහා ග්‍රාමීය කමිටු හා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිතව මා වෙත යොමු කල යුතුය.

05. ඉහත කරුණු කෙරෙහි අවධානය යොමුකර මෙම වර්ෂය සඳහා මහ භාණ්ඩාගාරය ලබා දී ඇති මුදල් ප්‍රතිපාදන සීමාව තුළ සමෘද්ධි සහනාධාර වැඩසටහන කළමනාකරණය කරගැනීමට ඔබ සැමගේ සහයෝගය ලබා දෙන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත්:-**

01. ලේකම්, (සමෘද්ධි ගෘහආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය,
සවයංරැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය) - ඔබ විසින් ලබා දී ඇති උපදෙස් හා බැඳේ.
02. ප්‍රධාන ගණකාධිකාරි (සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව) - අ.ක.ස. හා කා.දැ.පි.
03. ප්‍රධාන අභ්‍යන්තර විගණක - අ.ක.ස.
04. සියළුම අංශ ප්‍රධානින් - අ.ක.ස..